INTERNATIONAL BACCALAUREATE
BACCALAURÉAT INTERNATIONAL
BACHILLERATO INTERNACIONAL

M00/149/S

SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1
CINGALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1
CINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1

Monday 8 May 2000 (morning)
Lundi 8 mai 2000 (matin)
Lunes 8 de mayo del 2000 (mañana)

3 hours / 3 heures / 3 horas

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Section A: Write a commentary on one passage. Include in your commentary answers to all the questions set.
- Section B: Answer one essay question. Refer mainly to works studied in Part 3 (Groups of Works); references to other works are permissible but must not form the main body of your answer.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- Ne pas ouvrir cette épreuve avant d'y être autorisé.
- Section A : Écrire un commentaire sur un passage. Votre commentaire doit traiter toutes les questions posées.
- Section B : Traiter un sujet de composition. Se référer principalement aux œuvres étudiées dans la troisième partie (Groupes d'œuvres) ; les références à d'autres œuvres sont permises mais ne doivent pas constituer l'essentiel de la réponse.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Sección A: Escriba un comentario sobre uno de los fragmentos. Debe incluir en su comentario respuestas a todas las preguntas de orientación.
- Sección B: Elija un tema de redacción. Su respuesta debe centrarse principalmente en las obras estudiadas para la Parte 3 (Grupos de obras); se permiten referencias a otras obras siempre que no formen la parte principal de la respuesta.

<u>අ කොටස</u>

පහත සඳහන් ඡේද අතුරින් එකක් සඳහා විවරණයක් සපයන්න.

1 (අ)

රන් එතනාට කියන කවි.

රන් එළියට හැන්දෑවේ මුදු කෙහෙ දිලිසෙන්නේ
රන් ගෝමර පෙති ඉහිලා ළමැද බබුලුවන්නේ
රන් වන් වී කරලක් මෙන් බිමට නැමී ඉන්නේ
රන් එතනා ඉපනැල්ලේ මොනවද අවුලන්නේ

උදේ ඉඳන් වැඩ කරලා දතුයි ගොඩට එන්නේ
වෙලේ තමයි ජීවිතයම අවුවට කර වෙන්නේ
උඹෙ කැකිරි සිනා පොදක් මා වෙත හෙලමින්නේ
හිතේ තියෙන දුක ඉඳකට දුරු කරවාපන්නේ

මාස ගණන් වැස්ස නැතුව දිගටම පායන්නේ
වෙලි ලියදි දිය හිඳිලා ඉරි තැලිලා යන්නේ
වේලුණු බිම ගිනියම වී අවුව කැකෑරෙන්නේ
පෑළු කුඹුර ගැන සිහිවන කලට පසුව දන්නේ

බැන්ද වරල පිරාගෙන හෙමින් සැරේ එන්නේ
හැන්දෑවේ සිසිල් සුළඟ ඇඟ වට නලියන්නේ
අන්ධකාර දුරු කරවන මැණික් පාන වැන්නේ
කින්ද පාළු කුඹුරේ තව තනියම පසු වන්නේ

කාලෙට මහ වැහි වැහැලා සාගත දුරු වෙන්ටයි
වෙලි, ලියදි, ගං ඇල, දෙල පිරි ගලා යන්ටයි
වෙළුණු වැලි බිම තෙත්වී නැවුම් සුවඳ එන්ටයි
සාරව මුළු පොළොව එයින් ජීවය උතුරන්ටයි

ළා ගොයමේ නිල්ල ඇවිත් පොළොව වසා ගන්ටයි
හිනා කිරෙන් කිරි වැදිලා කරලින් බර වෙන්ටයි
ඇගේ පාට රන් කරලෙන් අස්වනු පිදෙන්ටයි
හිතේ සියලු දුක් කරදර අමතක කර ලන්ටයි

රන් එළියට හැන්දෑවේ මුදු කෙහෙ දිලිසෙන්නේ
රන් ගෝමර පෙති ඉහිලා ළමැද බබුලුවන්නේ
රන් පාටට එකතු වෙලා අඳුර ගලා එන්නේ
කින්ද පාළු කුඹුරේ තව තනියම පසුවන්නේ

මහගම සේකර, <u>නව කවි සරණිය</u>, 1976

- මෙම කවි පංතියෙහි සඳහන් රන්ඵතනා සහ කථකයා අතර නිරූපිත සම්බන්ධතාවේ ස්වභාවය පරීක්‍ෂා කරන්න.
- කවියා භාවිත කරන කාව්‍ය උපක්‍රම ගැන අදහස් දක්වන්න.
- මෙහි යොදා ඇති භාෂාවේ විශේෂ ලක්ෂණ කවරේ ද?
- මේ කවිය ඔබගේ සිත් ගතී ද?

1 (ආ)

කිසිම ආගමක් ඉන්ද්‍රිය ගොචර ස්ථූල වස්තූන්ගේ ස්වරූප හා ගති ගුණ නිරූපණය කෙරෙන විද්‍යාවක් නොවේ; පසිඳුරන්ටත් තර්කයටත් ගොචර නොවන තතු ඒ තතු අනුව හොඳ නරක, පව් පින් දුක සැප, යුතු-අයුතුකම්, යන ආදිය ද විවරණය කෙරෙන දර්ශනයකි; නොහොත් අධ්‍යාත්ම විද්‍යාවකි. පරමාර්ථ සත්‍යය අරබයා ආගම්වල දක්නා ලැබෙන්නේ අසමාන මත වුව ද ධර්ම නීතියත් සදාචාරයත් අරබයා නම් බෙහෙවින් දක්නා ලැබෙන්නේ සමාන මත බව පෙනේ. පරමාර්ථය සත්‍යය අරබයා වුව ද ආගම්වල දක්නා ලැබෙන අසමාන මත සාරය විසින් එතරම් අසමාන නොවේ.

බුදු සමය නවීන විද්‍යාවට අනුකූලයයි කියමින් තර්ක කරන්නන්ගෙන් වැඩි දෙන; භෞතික විද්‍යාව, දර්ශනය, ආගම, යන තුන, වෙනස් වෙනස් මංවලට බැස විශ්වයෙහි අවසාන තුතක් පිළිබඳ තතු ගොචර කොටගෙන සම්පාදනය කරන ලද දැනුම් වෙසෙස් බව අමතක කරන්නෝ ය. නවීන භෞතික විද්‍යාව ආශ්‍රයෙන් පහළ කරන ලද ඇතැම් දර්ශනවාද විශේෂයක දක්නා ලැබෙන සමහර මතයන් හා පොදුවේ බටහිර දර්ශනයන්හි එන ඇතැම් මතයන් හා ද සැසඳෙන මත නම් බෞද්ධ දර්ශනයෙහි පමණක් නොව පෙරදිග අනික් හැම දර්ශනයන්හි ද දක්නා ලැබෙන බව ඇත්තකි. එහෙත් ඒ මත නවීන විද්‍යාව නොවේ. ඒ මත විද්‍යාවෙන් බැහැර කරනු ලබන්නේ විද්‍යාව ගුරු කොට ගත් විධිය අනුව පරීක්ෂණයට හසු නොකළ හැකි තතු පිළිබඳ විවරණයන් වන බැවිනි.

නිර්මාණ වාදය තර්කයට එකඟයයි බටහිර සමහර පැරණි දර්ශනවාදීහු කීහ; ඔවුහු තර්කයෙන් නිර්මාන වාදය ඔප්පු කරනු පිණිස ග්‍රන්ථ සම්පාදනය කළහ. ඔවුන්ගේම තර්කය උඩ පිහිටා නිර්මාණ වාදය පරීක්ෂා කළ දර්ශනවාදීන්ගෙන් එකෙක් වන ඩේවිඩ් හියුම් 'ආගම තර්කයට ගොචර වෙතියි කියන පණ්ඩිතයෝ ආගමෙහි සතුරෝය' යි කී ය. හියුම් මෙසේ කීවේ නිර්මාණ වාදය සම්බන්ධයෙනි. තර්කයට හසු නොවන මත හැම ආගම්වලම ඇත; එහෙයින් නවීන විද්‍යාව ආගම් හා සැසඳෙතියි කියන්නන් ආගමෙහි මිතුරන් ලෙස සැලකිය හැකි ද? නොකළ හැකි, නොකළ යුතු ඒ සැසඳීම නිසා හානි වන්නේ ආගමට මිස විද්‍යාවට නොවේ.

මාර්ටින් වික්‍රමසිංහ, සිංහල ලකුණ, 1959

- මෙම කොටසේ දී කතුවරයා තහවුරු කරන්නට අදහස් කරන මතය කුමක් ද?

- ස්වකීය මතය තහවුරු කිරීම සඳහා ඔහු තම තර්ක සංවිධානය කර ඇති අයුරු පිරික්සන්න.

- සාර්ථක ලෙස භාෂාව පරිහරණය කර ඇති ආකාරය පරීක්ෂා කරන්න.

- කතුවරයාගේ අදහසට එකඟ විය හැකි ද?

ආ කොටස

පහත දැක්වෙන මාතෘකා අතුරින් එකක් යටතේ වාක්‍ය රචනයක් ලියන්න. **3** කොටසේ දී ඔබ හදාරා ඇති ග්‍රන්ථ අතුරින් යටත් පිරිසෙයින් දෙකක් වත් ඔබේ පිළිතුරට පදනම් විය යුතු ය. වෙනත් කෘති ගැන ද සඳහන් කිරීමට අවසර ඇත. එහෙත් එය පිළිතුරේ ප්‍රධාන අංශය නොවිය යුතු ය.

<u>සම්භාව්‍ය සාහිත්‍යය</u>

2. එක්කෝ

(අ) තෝරාගත් ග්‍රන්ථ දෙකක් ඇසුරු කරමින්, සම්භාව්‍ය සාහිත්‍යයේ වස්තු විෂයෙහි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ පරීක්ෂා කරන්න.

නැතහොත්

(ආ) ඔබ හදාරා ඇති සම්භාව්‍ය ග්‍රන්ථ දෙකක ප්‍රධාන චරිත නිරූපණය කොට ඇති ආකාරය සන්සන්දනාත්මකව පරීක්ෂා කරන්න.

<u>මුල් යුගයේ ප්‍රබන්ධ සාහිත්‍යය</u>

3. එක්කෝ

(අ) මුල් යුගයේ නවකථාකරුවන් ස්ත්‍රීත්වය හා ස්ත්‍රී චරිත කෙරෙහි දක්වන ආකල්පය ඔබ හදාරා ඇති ග්‍රන්ථ දෙකක් ඇසුරින් පිරික්සන්න.

නැතහොත්

(ආ) "මුල් යුගයේ නවකථාවල ප්‍රමුඛ අභිමතාර්ථය වී ඇත්තේ සමාජ විවරණයයි." ඔබට අභිමත නවකතා දෙකක් ඇසුරින් මෙම නිගමනයෙහි සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

<u>නූතන පද්‍ය</u>

4. එක්කෝ

(අ) රස උපදවන පරිදි දෘෂ්ටිගෝචර කවි සංකල්පනා භාවිත කිරීමෙහිලා නූතන කවීන් දක්වන සමත්කම් ඔබ හදාරා ඇති කාව්‍ය සංග්‍රහ දෙකක් ඇසුරින් පරීක්ෂා කරන්න.

නැතහොත්

(ආ) "නූතන කාව්‍යයෙන් පිළිබිඹු වන්නේ වර්තමාන සමාජයේ කටුක යථාර්ථය මිස සුන්දර සිහින ලොවක් නොවේ." ඔබ හදාරා ඇති කාව්‍ය සංග්‍රහ දෙකක් ඇසුරින් මෙහි සත්‍යාසත්‍යතාව පරීක්ෂා කරන්න.

<u>කෙටිකතා</u>

5. එක්කෝ

(අ) ඔබ හදාරා ඇති කෙටිකතාකරුවන් දෙදෙනෙකු චරිත නිරූපණය අතින් දක්වන සමත්කම් සත්සන්දනාත්මකව පරීක්ෂා කරන්න.

නැතහොත්

(ආ) "කෙටිකතාවක් රසවත් වීම සඳහා කතා පුවත ගලපන ආකාරය බෙහෙවින් වගකිව යුතුය." ඔබ හදාරා ඇති කෙටිකතා සංග්‍රහ දෙකක් ඇසුරින් මෙහි සත්‍යාසත්‍යතාව විමසන්න.

<u>නූතන ප්‍රබන්ධ</u>

6. එක්කෝ

(අ) "නූතන නවකථාකරුවා මනුෂ්‍යත්වයේ සැඟවුණු යථාර්ථයන් අවබෝධයෙන් යුතු ව හෙළිදරව් කරයි." ඔබ හදාරා ඇති නවකථා දෙකක මෙබඳු සැඟවුණු යථාර්ථයන් නිරූපිත ව ඇති ආකාරය පරීක්ෂා කරන්න.

නැතහොත්

(ආ) නූතන නවකථාවලින් ගැමි ජීවිතය සංකීර්ණත්වයෙන් තොර සරල දිවි පෙවෙතක් ලෙස නිරූපණය වෙතැයි යන මතය පිළිගත හැකි ද? ඔබ කියවා ඇති නවකථා දෙකක් ඇසුරින් නිදසුන් දක්වන්න.